Department of Education Sabaragamuwa Province/ Weekly School

**සති පාසල 23**

## තොරතුරු පත්‍රිකාව

### *කදා වළලු නාට්‍ය - 2 වන කොටස*

කදා වළලු නාට්‍ය අයත් වන්නේ මිශ්‍ර ශෛලියටයි. එනම් අර්ධ ශෛලිගත නාට්‍යයකි. අර්ධ ශෛලිගත නාට්‍යයක් යනු ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙකෙහිම ලක්ෂණ ඇතුළත් වන සේ නිර්මාණය වන නාට්‍යයි.

ඒ අනුව කදා වළලු නාට්‍යයේ පහත දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් වේ.

- සංවාද භාවිතය නාට්‍ය ශෛලීන් දෙකටම අනුව යොදා ගෙන තිබීම.
- රංග භූමි අලංකරණ භාවිත නො කිරීම.
- අංගරචනා නාට්‍ය ධර්මී ශෛලිය ට ගැළපෙන අයුරින් කර තිබීම.
- ජාතක කතාවක් පදනම් කොටගත් නාට්‍යයක් බැවින් ඊට අදාළ පරිදි වේෂභූෂණ නිර්මාණය කර තිබීම.
- නාට්‍ය ධර්මී ශෛලියෙහි ලක්ෂණ හා ලෝක ධර්මී ශෛලියෙහි ලක්ෂණ ප්‍රකට කරන සංවාද භාවිතය.

කදාවලලු නාට්‍යයේ සමස්ත සාර්ථකත්වය කෙරෙහි එහි යොදා ගත් චරිත සියල්ල ම එකසේ දායකත්වය සපයා ඇත.

- අතීත වක්තෘ ගේ ගායනයෙන් ආරම්භ වන නාට්‍යය අවසන් වන්නේ ද වන්නේ ද ඔහුගේ ගායනයෙනි.

- ධනයෙන් පිරිහුණු සිටු පවුලක අසරණ වූ මිත්තණිය කෙනෙකු හා මිනිබිරියක වන සිටු දුව යන චරිත.
- තත්කාලීන වාණිජය අර්ථ ක්‍රමය සංකේතවත් කරමින් ගෙන් ගෙට ගොස් විසිතුරු බඩු විකුණන වළලු වෙළඳුන් දෙදෙනාගේ චරිත.
- ධනයෙන් පිරිහුණු කල්හි රජවරුන්ට, සිටුවරුන්ට පවා අන්‍යන්ට අත පෑමට සිදුවේ යන ධර්මතාවය ප්‍රකට කරවමින් සිටු පවුලේ ඉතිරිව ඇති සාමාජිකයින් දෙදෙනාගේ චාරිත නාට්‍ය විකාශනයට ප්‍රබල දායකත්වයක් සපයා ඇත.
- අවස්ථාවට උචිත නුවණ භාවිත නොකළ කූඨ වෙළෙන්දෙකු වූ සේරිවාණිජ ද්වේෂයෙන් ක්‍රියා කරන ආකාරයත්, ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා අවංක බවිනුත් කටයුතු කළ කච්ඡපුට වෙළෙන්දාට ධනවතෙකු වීමට මඟ පෑදීමත් (කඩයක් දමා ගැනීමට මඟ පෑදීම) යන චරිත මඟින් ප්‍රේක්ෂකයාට ප්‍රබල පණිවිඩයක් ලබා දෙයි.
- ඒ ඒ චරිතවලට ගැළපෙන අයුරින් නිර්මාණය කරන ලද වේෂභූෂණ හා නාට්‍ය උපකරණ පිළිබඳව ද දක්නට ලැබේ.

<u>අභ්‍යාසය</u>

**කදා වළලු නාට්‍ය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

1. කදා වළලු නාට්‍යය අයත් වන්නේ කුමන ශෛලියට ද?
2. කදා වළලු නාට්‍ය එම ශෛලිය ට අයත් බව ප්‍රකාශ කිරීමට හේතු ලියා දක්වන්න.
3. කදා වළලු නාට්‍යයේ එන චරිත නම් කරන්න.
4. එම චරිතවල බාහිර හා අභ්‍යන්තර ලක්ෂණ චිත්‍ර සටහන් මඟින් ඉදිරිපත් කරන්න.
5. කදා වළලු නාට්‍යයේ එන ගැටුම් අවස්ථා නම් කරන්න.
6. නාට්‍යයේ දී භාවිත කළ නාට්‍යෝපකරණ නම් කරන්න.
7. කදා වළලු නාට්‍ය පෙළ සොයාගෙන කියවන්න.
8. අන්තර්ජාලය තුළින් කදා වළලු නාට්‍යයේ පින්තූර සොයා අධ්‍යනය කරන්න.